# ලංකාවේ ඉපැරැණි ලාක්ෂා කලාව සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යනයක්

*ඩී.ඩී.එස්.එච්. දිසානායක*[1]

ශ්‍රී ලංකාවේ ඉපැරණි ලාක්ෂා කලාව මහින්දාගමනයත් ලැබුණු ශිල්ප ක්‍රමයක් ලෙස සැලකෙන මෙම කලාව අතීතයේ රට පුරා පැතිර තිබු බවට ඉතිහාසයේ සඳහන් වේ. ලංකාවේ බහුල වසයෙන් ලාක්ෂා නිර්මාණ හමු වූ ප්‍රදේශ ලෙස මාතලේ හපුවිද, බලංගොඩ පල්ලේකන්ද, පාතදුම්බර, තංගල්ල ප්‍රදේශ පෙන්වා දිය හැකි ය. වර්ථමානයේ මාතලේ දිස්ත්‍රික්කය තුළ මෙම කලාව ව්‍යාප්ත ව පවති. මේ සඳහා අවශ්‍ය ලාකඩ ලබා ගන්නේ ලාක්ෂා කෘමියාගෙනි. එම කෘමියා කැප්පෙට්ටියා, කෝන්, හිගුරු යනාදි ගස්වල වාසය කරන අතර මෙම කෘමියා ශාකය තුළ වාසය කිරීම මඟින් ඔවුන්ගේ ශරීරය තුළින් පිටවන ඉටි වර්ගයක් මඟින් මෙම ලාකඩ නිපදවනු ලැබේ. වර්තමානයේ මේවාට අවශ්‍ය කරන ලාකඩ ඉන්දියාවෙන් ආනයනය කරනු ලබයි. මාගේ මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ මෙරට පවතින පාරම්පරික ලාක්ෂා කර්මාන්තයේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සංචාරක කර්මාන්තයට උචිත පරිදි යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමයි. ඒ සඳහා මා විසින් සාහිත්‍යමය සාධක පොත් පත් මඟින්ද ප්‍රායෝගික කරුණු මාතලේ හපුවිද පාරම්පරික ලාක්ෂා ගම්මානය මූලික කරගනිමින් කරන ලද ක්ෂේත්‍ර චාරිකා මඟින් ද එකතු කරගත්තේ ය. මෙම සාහිත්‍ය විමර්ශණය මඟින් සොයා ගත් කරුණු අනුව ලෝකයේ අනෙක් රටවල මෙම කලාවේ ව්‍යාප්තිය පිළිබඳ හඳුනා ගත හැකි විය. ජපානය, චීනය, බංගලාදේශය, ඉන්දියාව වැනි රටවල් තුළ නූතනයේ නිර්මාණ සිදු කරන අතර මෙරට සතු ලාක්ෂා කලාවේ හා අනෙකුත් රටවල හමු වන මෙම කලාවන්හී විශාල වෙනස්කම් පවති. මෙම වෙනස නිසා මෙරට ලාක්ෂා කලාව සුවිශේෂි තැනක් ගනි. එහෙත් අප තව මත් වෙළඳපොළ අවශ්‍යතා මත නිර්මාණ සිදු කරනුයේ අල්ප ලෙසට ය. එම නිසාවෙන් විශාල වෙළඳපළක් මේ වන විට අතිරික්තයක් ලෙස ලෝකය තුළ පවතී. ඒවායේ වාසි අනෙකුත් රටවල් ලබා ගනි. එහෙත් ඔවුන්ගේ නිර්මාණ මෙරට නිර්මාණ මෙන් උසස් කලාත්මක බවකින් යුක්ත ඒවා නො වේ. එහෙත් ඒවා පාරිභෝගික භාණ්ඩ වශයෙන් ඉහළ වටිනාකමක් තිබේ. අප රට තුළ කරනු ලබන නිර්මාණ සමරු ලෙස ගත හැකි නිර්මාණ වන අතර නවීන ලෝකයේ අවශ්‍යතා මත නිර්මාණය සිදු නොකිරීම විශාල ගැටලුවකි. ලාක්ෂා කර්මාන්තයේ ශිල්ප ක්‍රම යොදා ගනිමින් නව්‍ය වෙළඳපොළ මත නිර්මාණ සිදු කිරීම තුළින් ගෝලීය මෙන් ම සංචාරකයන්ගේ ආකර්ෂණය ද ලබා ගත හැකි ය. මේ සඳහා ගත යුතු පියවර ලෙස මෙම කලාවේ නිරත වන අයට නවීන වෙළඳපළ හා නවොත්පාදනයන් පිළිබඳ ව දැනුමක් ලබා දිමයි. එහෙත් ඉපැරණි තාක්ෂණික ශිල්ප ක්‍රම වන පට්ටල් හා නියපොතු වැඩ යන ක්‍රම ද යොදා ගනිමින් නිර්මණ සිදු කළ යුතු ය. එතුළින් කලාවේ අනන්‍යතාවන් ආරක්ෂා කරගත හැකි වේ. ඉන්දියාව වැනි රටවල ලාක්ෂා පට්ටලයට තාක්ෂණය එක් කර තිබේ. මෙවැනි ක්‍රම මෙරට තුළ භාවිත කිරීම තුළින් වෙළඳපළට තරඟකාරී ලෙස හා මහා පරිමාණ ලෙස නිෂ්පාදන යොමු කිරීමට හැකියාව ලැබේ. මා මෙම පර්යේෂණය තුළින් සොයා ගත් කරුණු තුළින් එළඹිය හැකි නිගමනය වන්නේ මෙරට මෙරට ලාක්ෂා කර්මාන්තයේ නිරත වන ශිල්පින්ට අවශ්‍ය කරන මූලික පහසුකම් ලබා දීම සහ වෙළඳපළ ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබා දීම තුළින් මෙරට සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ප්‍රායොගික ව යොදාගත හැකි බවයි.

***ප්‍රමුඛ පදඃ*** ලාක්ෂා කලාව, නවොත්පාදනය, සංචාරක කර්මාන්ත, ගෝලීය වෙළඳපළ, සාම්ප්‍රදායික කලාව

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, hansakashehan78@gmail.com